**ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළමතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේඅභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකිවිය..

(ආ) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍යප්‍රකාශන පිළියෙල කිරීමේඅවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකරන ලද සෑම සංඛ්‍යාත්මක තොරතුරක් සඳහා ඉකුත් වර්ෂයේ අනුරූපී සංඛ්‍යා දැක්විය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශනවල ඉකුත් වර්ෂයේ අනුරූපී සංඛ්‍යා දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මකභාවය තහවුරු කිරීම සඳහා අනුරූපී සංඛ්‍යා නිවැරදිව දැක්විය යුතුය. | එකඟ වේ. 2017 වර්ෂයේ අනුරූපී සංඛ්‍යා ඇතුලත් කිරීමට නොහැකි වී ඇත. |

### 1.6.2 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉහත චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත තොරතුරු භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල සඳහන් සංඛ්‍යාසමඟ එකඟ විය යුතු වුවත්, ගොඩනැගිලි පිරිවැය ලෙස රු.312,485,000 ක් දක්වා තිබුණද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල ගොඩනැගිලි පිරිවැය ඇතුලත්කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. | එකඟ වේ. අතපසු වීමකින් එම ශේෂය පරිගණකගත කිරීමට නොහැකි වී ඇත. එම වටිනාකම 2019 ගිණුම්වලට ඇතුලත් කිරීමට අපේක්ෂා කරමි. |
| (ආ) | 7(ii) ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිළධාරීන් වෙනුවෙන් එකතු කරන ලද ආදායම් භාණ්ඩාගාරයෙන් ලද අක් මුදල් ලෙස සලකා ගිණුම් ගත කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී වෙනත් ගණන්දීමේ නිළධාරීන් වෙනුවෙන් රැස් කළ රු.2,626,292 ක් භාණ්ඩාගාරයෙන් ලද අක් මුදල් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට බදු නොවන ආදායම් හා | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. | එකඟ වේ. අතපසු වීමකින් "බදු නොවන ආදායම් හා වෙනත් " තීරුව යටතේ ඇතුලත් කර ඇති අතර, 2019 වසරේ දී "ආදායම් නොවන ලැබීම්" තීරුව යටතට ඇතුලත් කිරීමට පියවර ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | වෙනත් ලැබීම් ලෙස සටහන් කර තිබුණි. | | |
| (ඇ) | 7(iv) ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වනු ලබන දේපළ, පිරියත හා උපකරණ වටිනාකමට සමාන වටිනාකමක් ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ දේපළ, පිරියත හා උපකරණ සංචිතය ලෙස දැක්විය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් දේපළ, පිරියත හා උපකරණ සංචිතය රු.9,704,978 ක් අඩුවෙන් දක්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. | එකඟ වේ. 2019 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේ දී එම තත්ත්වය නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ඇ) | 7(v) ඡේදය ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් වටිනාකමින් තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කර ශුද්ධ වත්කම් ගණනය කළ යුතු අතර ඒ අනුව දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් රු.8,837,839 ක ඍණ අගයක් විය යුතු වුවත්, රු.867,139 ක ධන අගයක් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. | එකඟ වේ. නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණකාධිකාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව යන්ත්‍ර හා උපකරණවල 2018 ජනවාරි 01 දිනට ශේෂය රු.4,599,297 ක් වුවද, 2017 වර්ෂයේ විසර්ජන ගිණුම අනුව එය රු.4,335,658 ක් වූයෙන් රු.263,639 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි ශේෂයන් උපයෝගී කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු වීම. | එකඟ වේ.නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |

**1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) මුදල් රෙගුලාසි 237 | දෙපාර්තමේන්තුව විසින් එකතුවරු.310,316 ක්වූ භාණ්ඩ හාවැඩ කාර්යයන් 9 ක් සඳහා එම කාර්යයන් ඉටු කර ඇති බවට හා බඩු ලැබුණු බවට තහවුරු කර නොගෙන ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ හා සේවා සැපයුම් සතුටුදායක මට්ටමකින් ඉටු වූ බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ගෙවීම් කළ යුතු වීම. | ගබඩා ලේඛනවලට ඇතුලත් කොට නියමිත මුද්‍රාව, වවුචර් පත්වල තබා තිබූ අතර, එහි අඩුපාඩු තිබූ බව පිළිගනිමි. ඒ නිවැරදි කිරීමට කටයුතු කරන බවද දන්වමි. |
| (ආ) මුදල් රෙගුලාසි 264 | දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.880,000 ක් වූ ගෙවීම් 8 ක් සඳහා මුදල් ලැබුණු බවට ආදායකයන්ගෙන් කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. | ආදායකයාගෙන් කුවිතාන්සි ලබා ගත යුතු වීම. | දෙපාර්තමේන්තුවෙන් ප්‍රාදේශීයව අනුයුක්ත කරන ලද සංවර්ධන නිළධාරීන් මඟින් සෑම ගෙවීමක් සඳහාම එහි වටිනාකමට කුවිතාන්සි ලබා ගැනීමටසටහන් කර ගතිමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයන් 4ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 4ක් සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන ලෙස රු,50,200,000 ක් සලසාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට මුළු ප්‍රතිපාදනයෙන් රු.20,256,014 ක් හෙවත් සියයට 6 සිට සියයට 100 දක්වා වූ පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. | මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව වර්ෂයේ අවශ්‍යතාවය නිසි පරිදි පුරෝකථනය කළ යුතු අතර අරමුදල් ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කළ යුතු වීම. | එකඟ වේ. 2018 වර්ෂයේ දෙසැම්බර් මාසයේ භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් අත් මුදල් නොලැබීම සහ වර්ෂය තුළ දී අමාත්‍යාංශය වෙනස්වීම මත ඇතැම් ප්‍රසම්පාදනයන් නියමිත දිනට සිදු කිරීමට නොහැකි වීම මෙම ඉතිරිය සඳහා හේතු විය. |

**2.2** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| වැය විෂයයන් දෙකක් සඳහා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව එළඹි බැරකම් වටිනාකම රු.189,810ක් වුවද, 2019 වර්ෂයේ වැය ලෙජරය අනුව රු.307,382 ක් වැය කර තිබුණි. තවද, එම වැය විෂයයන් 2 ට අදාල සමාලෝචිත වර්ෂයේ ඉතිරිය රු.215,940ක් විය. | සමාලෝචිත වර්ෂයට අදාළ බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර එසේ එළඹි බැරකම් සීමාව තුළ එළඹෙන වර්ෂයේ දී බැරකම් නිරවුල් කළ යුතු වීම. | එකඟ වේ. බිල්පත්‍ර හා වවුචර් පසුව ඉදිරිපත් වීම නිසා නිවැරදි බැරකම් ගිණුමේ සඳහන් කිරීමට නොහැකි විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර තිබුණි. එසේ වුවද, දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත අරමුදලක් වන මුස්ලිම් පුන්‍යාධාර අරමුදල හා ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් වන හජ් අරමුදල සඳහා ක්‍රියාකාරි සැලසුම් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර ඵලදායී ලෙස එම කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | එකඟයි. 2019 වසරේ දී හජ් අරමුදල හා මුස්ලිම් පුණ්‍යාධාර අරමුදල සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට කටයුතු කර ගෙන යනු ලැබේ. |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කරගෙන දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල ඉදිකර තිබුණි. එම ඉඩම දෙපාර්තමේන්තුව නමට පවරාගෙන ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට කටයුතුකර නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු වීම. | පවරා ගැනීමේ කටයුතුවලින් අඩක් අවසන් වී ඇති අතර, ඉතිරි කටයුතු සඳහා විධිමත් ක්‍රියා මාර්ග සිදු කරමින් පවතී. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **මුස්ලිම් පුනාාධාර අරමුදල** | | |
| | (i) ලියාපදිංචි මුස්ලිම් පල්ලියක, පුනාහාරයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 6ක ප්‍රමාණයක්ද, මුස්ලිම් සිද්ධස්ථානයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට10 ක්ද, මුස්ලිම් පුනාාධාර අරමුදලට ලබාදිය යුතු බව වකුෆ් පනතේ 4 වන පරිච්ඡේදයේ 43 (2) වගන්තිය යටතේ දක්වා තිබුණද, අදාළ පල්ලි හා සිද්ධස්ථාන වෙතින් ලැබිය යුතු නියම මුදල මුස්ලිම් පුනාාධාර අරමුදලට ලැබුණු බව පරීක්ෂා කිරීමට සුදුසු ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. | දායක මුදල් ලැබීම තහවුරු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී ප්‍රාදේශීය සංස්කෘතික නිලධාරීන් හරහා ඒවා අධීක්ෂණය කළ යුතු වීම. | එකඟයි. රාජා ගිණුම්කාරක සභාවේ ද නිර්දේශය පරිදි පසුගිය වසරේ අවසන් කාර්තුවේ සිට සියළුම පල්ලිවල තොරතුරු, පරිගණක ගත කිරීමේ විධිමත් වැඩ පිළිවෙළක් සකස් කොට ඊට අදාළ කටයුතු මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී. |
| | (ii) 2006 දෙසැම්බර් 22 දිනැති PF/423 දරන රාජා මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය පරිදි ව්‍යවස්ථාපිත හා භාර අරමුදල් සඳහා අරමුදලේ අරමුණුවලට අනුකූලව වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර ඒ අනුව වියදම් දැරිය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | එකඟයි. 2019 වසරේ දී අදාළ ලේඛන සකස් කොට මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීමට කටයුතු කෙරෙමින් පවතී. |
| (ආ) | **හජ් අරමුදල**<br>2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජා මුදල් චක්‍රලේඛයේ 3.3 ඡේදය අනුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වසා දැමීමට හෝ තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට කටයුතු කළ යුතු වුවත් මෙම අරමුදල සඳහා මෙතෙක් නීතිමය පදනමක් ලැබී නොතිබිණි. | චක්‍රලේඛයේ සඳහන් උපදෙස්වලට අනුව අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | මේ වන විට තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය මඟින් හජ් පනත් කෙටුම්පතක් සකස් කෙරෙමින් පවතී. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| "තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් අදාළ වන තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහාවන දර්ශකයන් ද හඳුනාගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අදාළ අරමුණු හඳුනාගෙන එම අරමුණු ඉටු කර ගැනීම සඳහා වන ඉලක්ක ස්ථාපිත කර එම ඉලක්කවලට ළඟා වීම මැන බැලීම සඳහා දර්ශක සකස් කළ යුතු වීම. | 2019 වර්ෂයට අදාළව එම දර්ශකයන් හඳුනා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 123 ක් ද, තත්‍ය කාර්ය මණ්ඩලය 90 ක් ද වූයෙන් පුරප්පාඩු 33 ක් පැවතුණි. තවද, දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 44.96 ක් වැය කර තිබුණු අතර වාර්ෂික ඒක පුද්ගල වියදම රු.510,726 ක් වී තිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතු වීම. | මෙම පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීම පිණිස රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය වෙත ඉල්ලීම් සිදු කර ඇත. |